**ශ්‍රී ලංකා ග්‍රහලෝකාගාරයේ**

**ක්ෂේත්‍රගත/ කාර්යාලගත නිලධාරී බණ්ඩ 01 සේවා ගණයෙහි (MN-06-2016)**

**කථිකාචාර්ය තනතුර සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය**

**01. සම්බන්ධ වන ආයතන**

| | | | |
|---|---|---|---|
| 1.1 | දෙපාර්තමේන්තුව : ශ්‍රී ලංකා ග්‍රහලෝකාගාරය | යොමු අංකය :ග්‍රහ /සේ.ව්‍ය.හා.බඳවා ගැනීම් | දිනය :2010.11.25 |
| 1.2 | අමාත්‍යාංශය : තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය | යොමු අංකය :ST/2/8/15 | දිනය :2012.09.05 |
| 1.3 | කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුර අනුමත කිරීම | යොමු අංකය :DMS/CS/09/04 | දිනය :2011.05.09 |
| 1.4 | ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය | යොමු අංකය :EST-3/RECRU/03/3832 | දිනය :2012.07.10 |
| 1.5 | ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය | යොමු අංකය : NSCC/6/7/106/SR | දිනය 2012.06.28 |
| 1.6 | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය | යොමු අංකය :PSC/EST/4/1/7/4/2012 | දිනය :2013.02.18 |

02. **පත්කිරීම් බලධරයා** : රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය පවරනු ලැබූ තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ ලේකම්

03. **සේවා ගණය පිළිබඳ විස්තර** :

3.1 සේවා ගණය : ක්ෂේත්‍රගත / කාර්යාලගත නිලධාරී - බණ්ඩ 1

3.2 ශ්‍රේණි : II හා I ශ්‍රේණිය

3.3 පැවරෙන කාර්යභාරය පිළිබඳ පොදු නිර්වචනය :

කාර්යයන්හි ස්වභාවය අනුව තත් කාර්යයන් ඉටු කිරීම සඳහා වන බඳවාගැනීමේ අවස්ථාවේදී අවම මූලික අධ්‍යාපන සුදුසුකම් වශයෙන් පිළිගත් විශ්වවිද්‍යාලයකින් පිරිනැමෙන උපාධි සුදුසුකම් සමඟ පශ්චාත් උපාධි සුදුසුකම් හෝ ඒ සමාන වෙනත් ප්‍රවීණතා හෝ වෘත්තිය කුසලතා අවශ්‍ය වන්නා වූද ආයතනයේ විධායක නිලධරයන්ගේ සහ ආයතන ප්‍රධානීන්ගේ කාර්යයන්ට සෘජුවම උපස්ථම්භක වන්නා වූද විධායක නිලධරයන්ගේ සෘජු අධීක්ෂණය යටතේ පවරනු ලබන්නා වූද කාර්යයන් වේ.

3.4 ශ්‍රේණිගත කාර්යයන් පැවරීම :

ශ්‍රේණිගත ව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාවය මත ජ්‍යෙෂ්ඨතාව හා කුසලතාවය පදනම් කොට ගෙන ඕනෑම ශ්‍රේණියක නිලධාරයෙකුට දෙපාර්තමේන්තු ප්‍රධාන විසින් පවරනු ලැබිය හැක.

**4. තනතුරෙහි / තනතුරුවල ස්වභාවය : ස්ථිර විශ්‍රාම වැටුප් සහිත**

**5. වැටුප් :**

5.1 වැටුප් කේත අංකය : MN6 2016

5.2 වැටුප් පරිමාණය :රු. 36585 – 10x660 – 11x755 – 15x930 – 65440/-

5.3 ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක වැටුප් පියවර :

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය (රු.) |
|---|---|---|
| II | පියවර 01. | රු. 36585.00 |
| I | පියවර 02. | රු. 65440.00 |

## 6. සේවා ගණයට අයත් තනතුර/ තනතුරු

6.1. අනුමත තනතුරු හා අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන් :

| අනුමත තනතුරු නාම | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|
| කථිකාචාර්ය | 02 | 1. ග්‍රහලෝකාගාරයේ භාවිතා වන ප්‍රක්ෂේපන යන්ත්‍ර භාවිතය සහ ඒවායේ නිරවද්‍යතාවය (ස්වභාවික අහසෙහි දත්ත අනුව ) සහතික කිරීම.<br>2. තාරකා විද්‍යාව හා අභ්‍යවකාශ විද්‍යාව පිලිබඳව පුහුණු වැඩසටහන් හා දර්ශන සංවිධානය කොට පවත්වාගෙන යාම.<br>3. තාරකා විද්‍යාත්මක මෘදුකාංග භාවිතයෙන් ශ්‍රී ලංකාවට ගැලපෙන පරිදි වැඩසටහන් සැකසීම සහ මෘදුකාංග භාවිතයෙන් දේශන පැවැත්වීම.<br>4. දිනපතා ස්වභාවික අහස නිරීක්ෂණය කිරීම හා වාර්තා තබා ගැනීම.<br>5. සූක්ෂම දුරේක්ෂ භාවිතයෙන් අහස නිරීක්ෂණය කිරීමට පුහුණු කිරීම සහ එම නිරීක්ෂණ වාර්තා වල නිරවද්‍යතාවය සහතික කිරීම.<br>6. විද්‍යා ප්‍රදර්ශන සඳහා ග්‍රහලෝකාගාර ආකෘති, කෘතිම අහස ආකෘති, තාරකා විද්‍යා ආකෘති යානා ආකෘති වල නිරවද්‍යතාවය අධීක්ෂණය.<br>7. ශ්‍රී ලංකාවට නිරීක්ෂණය වන ස්වාභාවික සංසිද්ධීන් පිලිබඳව දත්ත වාර්තා පවත්වාගෙන යාම සහ ග්‍රහලෝකාගාර වාර්ෂික කැලැන්ඩරය සැකසීම.<br>8. අදාළ අවස්ථාවන්හි දී මහා ජනතාව දැනුවත් කිරීමට අවශ්‍ය කටයුතු කිරීම.<br>9. තනතුරට අදාලව පවරනු ලබන අනෙකුත් කාර්යයන් . |

6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව : 02 - ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීමේ කාර්යය සඳහා II හා I ශ්‍රේණි ඒකාබද්ධ සේවක සංඛ්‍යාවක් සේ සැලකේ.

## 7. බඳවා ගැනීමේ ක්‍රමය

7.1. බඳවා ගන්නා අනුපාතය :

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | 100% |
| සීමිත | - |
| කුසලතා | - |

7.2. විවෘත බඳවා ගැනීම

7.2.1. බඳවා ගන්නා ශ්‍රේණිය : II ශ්‍රේණිය

7.2.2. සුදුසුකම්

7.2.2.1. අධ්‍යාපන සුදුසුකම් : (අ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක භෞතික විද්‍යාව හෝ ගණිතය ප්‍රධාන විෂයක් ලෙස සහ පරිගණක විද්‍යාව විෂය ඇතුළුව විද්‍යාව පිලිබඳව විශේෂ උපාධියක් ලබා තිබීම.

.

සටහන : අයදුම්කරුවන්ට ඇත්තේ ගණිතය හෝ භෞතික විද්‍යාව පිළිබඳ විශේෂ උපාධියක් නම්, සාමාන්‍ය විද්‍යා යෝග්‍යතා විභාගයේදී පරිගණක විද්‍යාව විෂයක් වශයෙන් සමත් වී තිබිය යුතුය.

හෝ

(ආ) භෞතික විද්‍යාව හෝ ගණිතය සහ පරිගණක විද්‍යාව ඇතුළුව පළවෙනි පන්තියේ හෝ දෙවැනි පන්තියේ විද්‍යාව පිළිබඳ සාමාන්‍ය උපාධියක් ලබා තිබීම.

සහ

(ඇ) තාරකා විද්‍යාව හෝ විද්‍යා ක්ෂේත්‍රයට අදාලව පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් හදාරා තිබීම.

7.2.2.2. වෘත්තීය සුදුසුකම් : අදාළ නොවේ.

7.2.2.3. පළපුරුද්ද : කථිකාචාර්ය, දේශක, ප්‍රදර්ශක (Demonstrator) යනාදී වශයෙන් තනතුරට අදාලව වසර 3 ක පළපුරුද්දක් ලබා දීම.

7.2.2.4. කායික සුදුසුකම් : දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හැකිවන පරිදි මනා කායික සහ මානසික යෝග්‍යතාවයකින් සිටිය යුතුය.

7.2.2.5. වෙනත් : I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

II. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

III. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කල යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

7.2.3. වයස :

7.2.3.1. අවම වයස් සීමාව: අවුරුදු 21 ට නොඅඩු.

7.2.3.2. උපරිම වයස් සීමාව : අවුරුදු 35 ට නොවැඩි.

7.2.4. බඳවා ගැනීමේ ක්‍රමය

7.2.4.1. ලිඛිත විභාගය :

| විෂයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | 100% | 40% |
| පොදු ප්‍රශ්න පත්‍රය | 100% | 40% |

(විෂය නිර්දේශය ඇමුණුම 01 මගින් දැක්වේ.)

7.2.4.1.1 පවත්වන බලධරයා : තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ ලේකම් විසින් බලය පවරනු ලබන ආයතනයක් මඟින්

7.2.4.2 වෘත්තිය පරීක්ෂණය : අදාළ නොවේ.

7.2.4.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය : අදාළ නොවේ.

7.2.4.3.1 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කරනු ලබන බලධරයා : අදාළ නොවේ.

7.2.4.4 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය : අදාළ වේ.

| පරිකෂා කර ලකුණු ලබා දෙනු ලබන ශිර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝර ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 1. දේශන පැවැත්වීමේ හැකියාව (ඉදිරිපත් කිරීමක් /Presentation කිරිමෙ හැකියාව ) | 60 | අදාළ නොවේ. |
| 2. තාරකා විද්‍යාව පිළිබඳ දැනුම | 25 | |
| 3. දුරේක්ෂ පිළිබඳ දැනුම | 10 | |
| 4. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ අභිමතය පරිදි කුසලතා, නායකත්වය, ආකල්ප පෞරුෂත්වය හා සන්නිවේදන කුසලතා | 5 | |

7.2.4.4.1 : ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරන බලධරයා : තාක්‍ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ ලේකම්

7.2.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : රජයේ ගැසට් පත්‍රයේ දැන්වීම් පල කිරීම හෝ ප්‍රසිද්ධ දැන්වීම් පළ කිරීම සහ වෙබ් අඩවියේ දැන්වීම් පළකිරීම මගින්.

7.3 සීමිත බඳවා ගැනීම : අදාළ නොවේ.

7.4 කුසලතාවය මත බඳවා ගැනීම : අදාළ නොවේ .

## 08. කාර්යක්ෂමතා කඩඉම :

| කුමන කාර්යක්ෂමතා කඩඉම ද යන වග | කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙරද | කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවය ලිඛිත පරීක්ෂණය/ වෘත්තිය පරීක්ෂණය / සහතික පාඨමාලාව / වෙනත් |
|---|---|---|
| 1 වන කාර්යක්ෂමතා කඩඉම | II වන ශ්‍රේණියට බඳවා ගෙන වසර 3ක් ගතවීමට පෙර | ලිඛිත පරීක්ෂණය (ඇමුණුම 02) |
| 2 වන කාර්යක්ෂමතා කඩඉම | I වන ශ්‍රේණියට උසස් වී වසර පහ (05)ක් ගතවීමට පෙර | ලිඛිත පරීක්ෂණය (ඇමුණුම 03) |

(විෂය නිර්දේශ ඇමුණුමක් වශයෙන් යා කොට ඇත.)

8.1 කාර්යක්ෂමතා කඩඉම් පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක්ද : වසරකට දෙවරක්

8.2 කාර්යක්ෂමතා කඩඉම් වලට අදාළ පරීක්ෂණ පවත්වනු ලබන බලධරයන් කවුරුන්ද :

1. වන කාර්යක්ෂමතා කඩඉම
2. වන කාර්යක්ෂමතා කඩඉම

} තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ ලේකම් හෝ ඔහු විසින් බලය පවරනු ලබන ආයතනයක් මගින්

## 09. රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය

9.1

| භාෂාව | ලබා ගත යුතු ප්‍රවීණතාවය |
|---|---|
| 01 රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යකින් සේවයට බඳවා ගත් නිලධාරින් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය පරිවාස කාලය තුලදී ලබා ගත යුතුය. |
| 02 අනෙක් රාජ්‍ය භාෂාව | රා.ප.ච.ලේ.7/2007 හා ඊට අනුශාංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ ප්‍රවීණතාවය ලබා ගත යුතුය. |

## 10. ශ්‍රේණි උසස් කිරීම

10.1 II ශ්‍රේණියේ සිට I වන ශ්‍රේණියට උසස් කිරීම :

10.1.1 සාමාන්‍ය කාර්යය සාධනය අනුව

10.1.1.1. සපුරාලිය යුතු සුදුසුකම්

I. පත්වීම් ස්ථිර කර තිබීම.

II. සේවා ගණයේ II ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහය (10) ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා නියමිත වැටුප් වර්ධක අගය දහය (10) ක් උපයාගෙන තිබීම.

III. අනුමත කාර්ය සාධන ඇගයීමේ පටිපාටිය අනුව උසස් වීමේ දිනට පෙරතුව වූ වසර දහය (10) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්යය සාධනයක් පෙන්නුම් කර තිබීම.

IV. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

V. අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගෙන තිබීම.

VI. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම.

10.1.1.2. උසස් කිරීමේ ක්‍රමය

සුදුසුකම් සම්පූර්ණ කරන ලද නිලධාරින් I ශ්‍රේණියට උසස් කිරීම සඳහා පත් කිරීමේ බලධාරියා වෙත අදාළ නිලධාරියා විසින් නියමිත ආකෘති පත්‍රයට අනුව ඉල්ලීමක් කරනු ලැබූ විට , පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි සිදු කරනු ලැබේ.

10.1.2. සුවිශේෂී කාර්යය සාධනය අනුව

10.1.2.1 සපුරාලිය යුතු සුදුසුකම්

I පත්වීම් ස්ථිර කර තිබීම.

II සේවා ගණයේ II ශ්‍රේණියේ වසර හය (06) ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක හය (06)ම නියමිත දිනට උපයාගෙන තිබීම.

III අනුමත කාර්ය සාධන ඇගයීමේ පරිපාටිය අනුව පූර්වාසන්න වසර හය (06) තුළම සුවිශේෂී කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

IV උසස්වීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළම සතුටුදායක සේවා කාලයක් ඉටුකර සම්පූර්ණ කර තිබීම.

V අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයට නියමිත දිනට සමත් වී තිබීම.

VI අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව නියමිත කාලය තුළ ලබා ගෙන තිබීම.

සංලක්ෂය : සුවිශේෂී කාර්ය සාධනය ඇගයීමේ ක්‍රමවේදයක් රජය විසින් හඳුන්වාදී ක්‍රියාත්මක කරන තෙක් දැනට ක්‍රියාත්මක වන වාර්ෂික කාර්ය සාධන ඇගයීමේදී සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කරනු ලැබ ඇති තැනැත්තන්ට සුවිශේෂී කාර්ය සාධනය යටතේ උසස් කිරීම් සඳහා වන ලිඛිත අභියෝග්‍යතා පරීක්ෂණය සඳහා පෙනී සිටීමට අවස්ථාව සලසා දෙනු ලැබේ.

සාමාන්‍ය මට්ටමේ කාර්ය සාධනය අනුව උසස් කිරීමේදී නියමිත දිනට කාර්යක්ෂමතා කඩඉම සමත් නොවන නිලධාරීන්ගේ උසස් වීමේ දිනය කාර්යක්ෂමතා කඩඉම සමත් වීමට ප්‍රමාද වූ කාලයට සමාන කාලයකින් ප්‍රමාද කල යුතුය.

10.1.2.2. උසස් කිරීමේ ක්‍රමය: ඉහත සුදුසුකම් සපුරාලන නිලධරයන්ට පත්කිරීම් බලධරයා අනුමත කරන ආයතනයක් විසින් පවත්වනු ලබන ලිඛිත අභියෝග්‍යතා පරීක්ෂණයකට පෙනී සිටිය හැක. ඉන් සමත්වන්නන් විසින් නියමිත ආකෘති පත්‍රය අනුව පත්කිරීම් බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට, පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කරනු ලැබේ. අදාළ සෙසු අවශ්‍යතාවන්ද සම්පූර්ණ කර ඇති නිලධරයන් පත් කිරීමේ දින සිට වසර හය (06) ක් සම්පූර්ණ වන දිනට ක්‍රියාත්මක වන පරිදි I ශ්‍රේණියට උසස් කිරීම පත්කිරීමේ බලධරයා විසින් සිදු කරනු ලැබේ.

(අභියෝග්‍යතා පරීක්ෂණය : විෂය නිර්දේශය - ඇමුණුම 04)

සටහන :

I. සුවිශේෂී කාර්යසාධනය යටතේ උසස් කිරීම් ලබාදීමේදී පවත්වනු ලබන පරීක්ෂණයෙන් සමත්වීම සඳහා අවම වශයෙන් ලකුණු 60%ක් ලබා ගත යුතුය. තවද, සුවිශේෂී කාර්ය සාධනය යටතේ උසස් කිරීමේ පරීක්ෂණය වර්ෂයකට එක වරක් පවත්වනු ලබන අතර, නිලධාරියකුට පෙනී සිටිය හැක්කේ එක් වතාවක් පමණි.

II. නිලධරයකුට පාලනය නොහැකි විශේෂ හේතුවක් මත නියමිත දිනට සුවිශේෂී කාර්ය සාධනය යටතේ උසස් කිරීමේ පරීක්ෂණයට පෙනී සිටීමට නොහැකි වූ අවස්ථාවන්හි දී පසුව පැවැත්වෙන අභියෝග්‍යතා පරීක්ෂණයට එම නිලධරයාට පෙනී සිටිය හැක. එවැනි නිලධරයකු සුවිශේෂී කාර්ය සාධනය යටතේ උසස් කිරීම සිදු කරන දිනය ලෙස සලකනුයේ එම විභාගය සමත් වූ දිනය වේ.

11. **තනතුරු වලට පත්කිරීම** : අදාළ නොවේ.

**12. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීතිවල දැක්වෙන සේවා කොන්දේසි වලට පරිබාහිර වන්නා වූ කොන්දේසි :**

සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යය පරිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසි සහ ආයතන සංග්‍රහයේ විධිවිධාන වලට අදාළ වේ.

**13. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යය පරිපාටික රීති වල දැක්වෙන අර්ථ නිරූපණ වලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපණ :**

සක්‍රීය සේවා කාලය යනුවෙන් අදහස් කරනුයේ ස්වකිය තනතුරට අදාළ වැටුප් ලබමින් සත්‍ය වශයෙන්ම රාජකාරියෙහි යෙදී සිටි සේවා කාලය වේ.රජයෙන් අනුමත ප්‍රසූත නිවාඩු හැර අනෙකුත් සියළුම වැටුප් රහිත නිවාඩු කාල පරිච්ඡේදයන් සක්‍රීය සේවා කාලය ලෙස ගණනය කරනු නොලබන්නේය .

**14. ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය :**

මෙම බඳවා ගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක වන දිනට සේවයේ යෙදී සිටින්නන්ට පමණක් අදාළ වේ.

මෙම බඳවා ගැනීමේ පටිපාටිය ක්‍රියාත්මක වන දින සිට රාජ්‍ය පරිපාලන අංක 03/2016 හා ඊට අනුෂාංගික චක්‍රලේඛ මගින් ලබා දී ඇති MN–06–2016 වැටුප් පරිමාණය යටතේ වැටුප් ලබන මෙම මධ්‍යස්ථානයෙහි කථිකාචාර්ය තනතුරේ සේවය කරන නිලධාරියා ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 4 වන වගන්තියේ විධිවිධාන වලට යටත්ව I ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

සේවා කාලය ගණන් ගනු ලබන්නේ ඒ ඒ තනතුරට පත් කරන ලද දිනය පදනම් කරගෙනය. කෙසේ වෙතත් අන්තර්ග්‍රහණය හේතුවෙන් අදාළ තැනැත්තාගේ වැටුප් වර්ධක දිනයෙහි වෙනසක් සිදු නොවිය යුතු අතර එම දිනය අන්තර්ග්‍රහණයට පෙර පැවති වැටුප් වර්ධක දිනය වශයෙන් නොවෙනස්ව ක්‍රියාත්මක විය යුතුය. එසේම වැටුප් පරිවර්තනයේදී අදාළ තැනැත්තා අවසන් වරට ලබමින් සිටි වැටුප් පියවර නව වැටුප් පියවරට අනුරූපී වීම මත ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 4.4 වගන්තිය අනුව ඊළඟ ඉහළ වැටුප් පියවරේ තැබීමද සිදු නොකළ යුතුය.

15. මෙම බඳවා ගැනීමේ පටිපාටියේ විධිවිධාන සලසා නොමැති යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

සකස් කළේ :.................................................
අත්සන :.................................................
(විෂය භාර කනිෂ්ඨ මාණ්ඩලික නිලධාරියා)

නම :.................................................
තනතුර :.................................................
දිනය :.................................................

පරීක්ෂා කළේ :.................................................
අත්සන :.................................................
(විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරියා)

නම :.................................................
තනතුර :.................................................
දිනය :.................................................

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන :.................................................
(දෙපාර්තමේන්තු ප්‍රධානී)

නම :.................................................
තනතුර :.................................................
නිල මුද්‍රාව :.................................................

දිනය :.................................................

---

යොමු අංකය : ටී.ආර්./2/8/ග්‍රහ/15

ශ්‍රී ලංකා ග්‍රහලෝකාගාරයෙහි කථිකාචාර්ය තනතුර සඳහා යෝජිත මෙම බඳවා ගැනීමේ පරිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

අත්සන :.................................................
නම :.................................................
ලේකම්,
තාක්ෂණ , පර්යේෂණ හා පරමාණුක බලශක්ති අමාත්‍යාංශය

දිනය :.................................................

නිල මුද්‍රාව :.................................................

---

යොමු අංකය : PSC/EST/4/1/7/4/2012

ශ්‍රී ලංකා ග්‍රහලෝකාගාරයෙහි කථිකාචාර්ය තනතුර සඳහා වන මෙම බඳවා ගැනීමේ පරිපාටිය 2013.02.18 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදී.

අත්සන :- ......................................................
නම :- ......................................................
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව

දිනය :.................................................

නිල මුද්‍රාව :- ......................................................

**ඇමුණුම 01**

1.විභාගයේ නම : ශ්‍රී ලංකා ග්‍රහලෝකගරයෙහි කථිකාචාර්ය තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය.

2. විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 1. බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40% |
| 2. පොදු ප්‍රශ්න පත්‍රය | පැය 01 | 100 | 40% |

3.විභාගය පවත්වනු ලබන බලධරයා : තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ ලේකම් හෝ ඔහු විසින් බලය පවරනු ලබන ආයතනයක් මඟින්.

4.විභාගය පවත්වනු ලබන කාලසීමාව : පුරප්පාඩු පැවතීම අනුව

5. විභාගය සඳහා වන නිර්දේශය

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 1. බුද්ධි පරීක්ෂණය | අපේක්ෂකයා සතු සාමාන්‍ය බුද්ධිය, තර්කන හැකියාව, අදහස් ප්‍රකාශනය, සංඛ්‍යාත්මක කුසලතාවය හා අවබෝධාත්මක හැකියාව මැන බැලෙන ප්‍රශ්න පත්‍රයකි. |
| 2. පොදු ප්‍රශ්න පත්‍රය | සංයුක්ත ගණිතය/ශුද්ධ ගණිතය හා ව්‍යවහාරික ගණිතය, භෞතික විද්‍යාව, පරිගණක විද්‍යාව, තාරක විද්‍යාව , අභ්‍යවකාශ විද්‍යාව, නව සොයාගැනීම් පිළිබඳ දැනුම මැන බලන ප්‍රශ්න පත්‍රයකි. |

සකස් කළේ : .......................................
අත්සන : .......................................
නම : .......................................
තනතුර : .......................................
දිනය : .......................................

පරීක්ෂා කළේ : .......................................
අත්සන : .......................................
නම : .......................................
තනතුර : .......................................
දිනය : .......................................

අත්සන: .......................................
(දෙපාර්තමේන්තු ප්‍රධානී)

නම : .......................................
තනතුර : .......................................
දිනය : .......................................
නිල මුද්‍රාව : .......................................

ඇමුණුම 02

1. විභාගයේ නම : ශ්‍රී ලංකා ග්‍රහලෝකාගාරයෙහි ක්ෂේත්‍රගත / කාර්යාලගත නිලධාරී ඛණ්ඩ 01 සේවා ගණයෙහි කථිකාචාර්ය තනතුර සඳහා වන 1 වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය .

2. විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 1.ආයතන රෙගුලාසි හා කාර්ය පරිපාටික රීති | පැය 01 | 100 | 40% |
| 2.මුදල් රෙගුලාසි පිළිබඳ මූලික දැනුම | පැය 01 | 100 | 40% |

3. විභාගය පවත්වනු ලබන බලධරයා : තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ ලේකම් හෝ ඔහු විසින් බලය පවරනු ලබන ආයතනයක් මඟින්

4. විභාගය පවත්වනු ලබන කාලසීමාව : වසරකට දෙවරක්

5. විභාගය සඳහා වන නිර්දේශය

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශනය |
|---|---|
| 1. ආයතන රෙගුලාසි හා කාර්ය පරිපාටික රීති | I. ආයතන සංග්‍රහයේ I,II,III,V,VI,VII,<br>II. IX,XI,XXIII,XXV,XXVI,XXVII ,XXVIII,XXIX,XXX,XXXI.<br>III. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පරිපටික රීති. |
| I. මුදල් රෙගුලාසි පිළිබඳ මූලික දැනුම | මුදල් රෙගුලාසි IV,V,VI,IX පරිච්ඡේද |

සකස් කළේ : .......................................
අත්සන : .......................................
නම : .......................................
තනතුර : .......................................
දිනය : .......................................

පරීක්ෂා කළේ : .......................................
අත්සන : .......................................
නම : .......................................
තනතුර : .......................................
දිනය : .......................................

අත්සන: ........................................
(දෙපාර්තමේන්තු ප්‍රධානී)

නම : .......................................
තනතුර : .......................................
දිනය : .......................................
නිල මුද්‍රාව : .......................................

ඇමුණුම 03

1.විභාගයේ නම : ශ්‍රී ලංකා ග්‍රහලෝකාගාරයෙහි ක්ෂේත්‍රගත / කාර්යාලගත නිලධාරී බණ්ඩ 01 සේවා ගණයෙහි කථිකාචාර්ය තනතුර සඳහා වන 11 වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය .

2.විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 1.විෂයානු බද්ධ දැනුම | පැය 01 | 100 | 40% |

විභාගය පවත්වනු ලබන බලධරයා : තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ ලේකම් හෝ ඔහු විසින් බලය පවරනු ලබන ආයතනයක් මඟින්

4. විභාගය පවත්වනු ලබන කාලසීමාව : වසරකට දෙවරක්

5. විභාගය සඳහා වන නිර්දේශය

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශනය |
|---|---|
| විෂයානු බද්ධ දැනුම | තාරකා විද්‍යාව , අභ්‍යවකාශ විද්‍යාව, ග්‍රහලෝකාගාර උපකරණ පිළිබඳ දැනුම මැන බැලීමේ ප්‍රශ්න පත්‍රයකි |

සකස් කළේ : .......................................
අත්සන : .......................................
නම : .......................................
තනතුර : .......................................
දිනය : .......................................

පරික්ෂා කළේ : .......................................
අත්සන : .......................................
නම : .......................................
තනතුර : .......................................
දිනය : .......................................

අත්සන: .......................................
(දෙපාර්තමේන්තු ප්‍රධානී)

නම : .......................................
තනතුර : .......................................
දිනය : .......................................
නිල මුද්‍රාව : .......................................

ඇමුණුම **04**

1.විභාගයේ නම : ශ්‍රී ලංකා ග්‍රහලෝකාගාරයෙහි ක්ෂේත්‍රගත / කාර්යාලගත නිලධාරී බණ්ඩ 01 සේවා ගණයට අදාළ සුවිශේෂී කාර්ය සාධනය යටතේ උසස් කිරීමට අදාළ අභියෝගාතා පරීක්ෂණය.

2.විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| අභියෝගාතා පරීක්ෂණය | පැය 01 | 100 | 60% |

3. විභාගය පවත්වනු ලබන බලධරයා : තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ ලේකම් හෝ ඔහු විසින් බලය පවරනු ලබන ආයතනයක් මගින්

4. විභාගය පවත්වනු ලබන කාලසීමාව : අවශ්‍යතාවය පරිදි වසරකට වරක්

5. විභාගය සඳහා වන නිර්දේශය

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශනය |
|---|---|
| අභියෝගාතා පරීක්ෂණය | තමා වෙත පැවරෙන කාර්යයන් සාමාන්‍ය කාර්යක්ෂමතාවයකින් යුතුව ඉටු කිරීම සඳහා අවශ්‍ය වන දැනුම, කුසලතා හා ආකල්ප අත්පත් කර ගෙන තිබේද යන්න මැන බැලීමේ පරීක්ෂණයකි. |

සකස් කළේ : .......................................
අත්සන : .......................................
නම : .......................................
තනතුර : .......................................
දිනය : .......................................

පරීක්ෂා කළේ : .......................................
අත්සන : .......................................
නම : .......................................
තනතුර : .......................................
දිනය : .......................................

අත්සන: .......................................
(දෙපාර්තමේන්තු ප්‍රධානී)

නම : .......................................
තනතුර : .......................................
දිනය : .......................................
නිල මුද්‍රාව : .......................................